www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරන ප්‍රතිපල පන්ති ගැටුම සඳහා වේදිකාව සකසයි

## Sri Lankan election result sets stage for class conflict

2010 අප්‍රේල් 10

කේ. රත්නායක විසිනි

පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) අප්‍රේල් 08 දින පැවති මැතිවරනයේදී පාර්ලිමේන්තු ආසන වලින් අති මහත් බහුතරයක් දිනාගත්තේ ය. එහෙත්, වැඩකරන ජනතාව අතර පුලුල් වශයෙන් පැතිර පැවති අප්‍රසාදය පෙන්නුම් කල, ඓතිහාසිකව පහත මට්ටමකට වැටී තිබුනු ඡන්දදායකයන්ගේ සහභාගිත්වය හා සියලු ප්‍රධාන ධනපති පක්ෂවල සහයෝගය සෝදාපාලු වීමෙන්, පාලන සංස්ථාපිතයම කම්පනයට පත් කලේය.

1948 නිදහස ලැබීමෙන් පසුව වාර්තාගත පහත්ම ඡන්ද දැමීමේ අගය වූ සියයට 64 පරයා යමින් මෙවර එය සියයට 52 දක්වා ගිලී ගියේය. 26 වසරක සිවිල් යුද්ධයෙන් පීඩාවට පත්ව සිටින යාපනය දිස්ත්‍රික්කයේ ඡන්දය පාවිච්චි කිරීම ඊටත් වඩා පහල මට්ටමක පැවති අතර එය යන්තම් සියයට 23 ක් පමනි. එය පෙන්නුම් කලේ දෙමල සුලුතරයේ අවශ්‍යතා වෙනුවෙන් පෙනීසිටින බව පැවසූ පක්ෂ ද ඇතුලුව සෑම පක්ෂයක් කෙරෙහිම පොදුවේ පලවූ පිලිකුලයි.

ප්‍රතිපල ලේඛනගත කර ඇත්තේ මැතිවරන දිස්ත්‍රික්ක 22 න් 20 ක පමනි. ඡන්ද මධ්‍යස්ථාන දූසිම් ගනනක දී එජනිස මැරයන් විපක්ෂයේ ආධාරකරුවන් ඡන්දය දීමෙන් වැලැක්වූ බවට චෝදනා එල්ල වීමෙන් පසුව, නුවර හා ත්‍රිකුනාමලයේ ඡන්ද ගනන් කිරීම අත්හිටුවන ලදී. දැනට 225 කින් යුත් පාර්ලිමේන්තු ආසන වලින් 117 ක් එජනිස විසින් දිනාගෙන ඇත. දිස්ත්‍රික්ක දෙක පිලිබඳව අවසන් තීරනයකට එලඹීමෙන් පසුව හා ජාතික ලැයිස්තු මන්ත්‍රීන් 29 දෙනා පත්කිරීමෙන් පසුව එයට හිමිවන ආසන සංඛ්‍යාව තවත් වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජනවාරියේ පැවති ජනාධිපතිවරනයේ ඡන්දය දීමේ රටාවට අනුව එජනිස ඡන්ද පදනම වූයේ ග්‍රාමීය දිස්ත්‍රික්කයි. ආන්ඩුව, බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහිව හමුදාව ලැබූ ජයග්‍රහනය වාර්ගික ආතතීන් ඇවිලවීම සඳහා ගසාකෑවේය. එහෙත් ආන්ඩුවේ යුද්ධයට හා වෙලඳපොල ගැති ආර්ථික න්‍යාය පත්‍රයට සිය පිටුබලය ලබාදුන් ප්‍රධාන විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ), ආන්ඩුවට එරෙහිව කිසිදු මූලික මතභේදයක් නොතිබීමේ කාරනය එම පක්ෂ ලත් මැතිවරන පරාජයේ මූලික සාධක බවට පත්ව තිබේ.

"මෙම ප්‍රබල ජයග්‍රහනය මහින්ද චින්තනයට ලැබුනු ජන වරමක්" ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ වහාම හුවා දැක්වීය. එහෙත් මෙය පුහු ජයග්‍රහනයකි. යන්තම් දෙමසකට පෙර පැවති ජනාධිපතිවරනයේදී ලත් ඡන්ද සංඛ්‍යාව සමඟ සසඳන කල මෙවර එජනිස ඡන්ද ප්‍රමානය දශලක්ෂයකින් පමන පහත වැටී ඇත. නුවර හා ත්‍රිකුනාමලය හැරෙන්නට එහි සමස්ත සහයෝගිතා පදනම මුලු ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 30 ක් පමනි.

රාජපක්ෂගේ ආඥාදායක තන්ත්‍රය පැලපදියම් කිරීමේ ව්‍යවස්ථාදායක වෙනස්කම් සඳහා අවශ්‍ය තුනෙන් දෙකේ බහුතරය වෙනුවෙන් ආන්ඩුව එක දිගට උද්ඝෝෂනය කලේය. ප්‍රවාහන ඇමති ඩලස් අලහප්පෙරුම පෙර දිනයේදී මාධ්‍ය වෙත ප්‍රකාශ කලේ, තුනෙන් දෙකේ බහුතරය සඳහා අවශ්‍ය ප්‍රමානයට වඩා 10-12 අතර ගනනකින් අඩු ආසන සංඛ්‍යාවක් එජනිස ලැබෙනු ඇතැයි තමන් බලාපොරොත්තුවූ බවයි. කෙසේ වෙතත්, නිල ප්‍රතිපල නිකුත්වූ වහාම ආන්ඩුව විපක්ෂයේ මන්ත්‍රීන් බිලිබාගැනීමට උත්සාහ කරනු ඇත.

නොවැම්බරයේ පටන් කල්දමා ඇති අයවැය, ආන්ඩු න්‍යාය පත්‍රයේ අංක එකට පැමින තිබේ. සාමය හා සෞභාග්‍ය ගෙන දෙන බවට කල රාජපක්ෂගේ ප්‍රකාශ කෙසේ වෙතත් ආර්ථිකය ගෝලීය අර්බුදයෙන් දරුනු ලෙස බැටකා ඇති අතර නය බරින් මිරිකී ඇත. පසුගිය වසරේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 2.6 ක නයක් ගැනීමට ආන්ඩුවට බල කෙරුනු අතර එලඹෙන වසරේදී අයවැය හිගය අඩකින් කපාහැරීම ද ඇතුලු කප්පාදු පියවර මාලාවක්ම ජාමූඅ විසින් ඉල්ලා තිබේ.

මැතිවරන ප්‍රතිපල විරුද්ධ පක්ෂ වලට මරු පහරක් වී තිබේ. ජනාධිපතිවරනයේදී එජාප හා ජවිපෙ යන ප්‍රධාන විරුද්ධ පක්ෂ පොදු අපේක්ෂකයා ලෙස විශ්‍රාමික ජෙනරාල් හා හිටපු හමුදාපති සරත් ෆොන්සේකා වටා පෙලගැසුනහ. ෆොන්සේකාට සහාය දීම මගින් ඔවුන් බලාපොරොත්තු වූයේ තමන්ගේ ද උදව්වෙන් ලබාගත් මිලිටරියේ ජයග්‍රහනය රාජපක්ෂගෙන් උදුරා ගැනීමටයි. හමුදාපති වශයෙන් රාජපක්ෂගේ සාපරාධී යුද්ධය ගෙනයාමේ වගකීම දැරුවේ ෆොන්සේකාය. එහි ප්‍රතිපලය වශයෙන් යුද්ධයේ අවසන් අදියරෙහිදී දහස් ගනනක් දෙමල සිවිල් වැසියෝ මරුමුවට පත්වූහ.

ජනාධිපතිවරනයෙන් පසුව මැතිවරන සන්ධානය බිඳී ගිය අතර එජාප හා ජවිපෙ පාර්ලිමේන්තු මැතිරනයේදී වෙන වෙනම තරග කලහ. සිය ආධාරකරුවන් දුසිම් ගනනක් සමග කුමන්ත්‍රනයක් සැලසුම් කලේය යන ගොතන ලද චෝදනා යටතේ සිරගත කල ෆොන්සේකා සමග ජවිපෙ, තමන්ගේ ම ඩීඑන්ඒ හෙවත් ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය ගොඩනගා ගත්තේය. මිලිටරි අත්අඩංගුවේ පසුවන ඔහු කුමන්ත්‍රන චෝදනා යටතේ නොව, තනතුරේ සිටිය දී දේශපාලන කටයුතුවල නිරතවූ බවට හා දූෂන ක්‍රියාවන්ට සම්බන්ධ බවට එල්ල කල චෝදනා යටතේ මිලිටරි අධිකරනයක් හමුවට පත්කර තිබේ.

මහනුවර හා ත්‍රිකුනාමලය දිස්ත්‍රික්ක හැරුනු කල, එජාප හා ජවිපෙ ලබාගත්තේ ඡන්ද දොලොස් ලක්ෂයක් පමනි. ඔවුන් ජනාධිපතිවරනයේදී ඡන්ද තිස්නව ලක්ෂයක් ලබාගත්හ. පරාජය පිලිගනිමින් එජාප මහලේකම් තිස්ස අත්තනායක ප්‍රකාශ කලේ, ප්‍රතිපලවල නීත්‍යානුකූල භාවයට තම පක්ෂය අභියෝග නොකරන බවත් "අනාගතයේදී ඡන්දදායකයන් ආකර්ෂනය කරගන්නා" පරිදි එය ප්‍රතිසංවිධානය කරන බවත් ය.

දැනට එජාපය ලබාගෙන ඇත්තේ ආසන 41 ක් පමනි. 2004 මහ මැතිවරනයෙන් පසුව එයට මන්ත්‍රීන් 81 දෙනෙක් අයත්වූ අතර ලොකුම පාර්ලිමේන්තු කන්ඩායම විය. කෙසේ වෙතත් ජනාධිපති තනතුර හොබවන හා පසුකාලයේදී දුසිම් ගනනක් එජාප මන්ත්‍රීන් මෙන්ම කුඩා හවුල්කාරයන් ද ආන්ඩුවට වැද්ද ගනිමින් එජනිස, අස්ථාවර සභාගයක් ගොඩනගාගෙන තිබුනි.

එජාපය සරලව ම රාජපක්ෂ ආන්ඩුවට විකල්පයක් ලෙස නොසැලකීම නිසා, වැඩ කරන ජනතාවට එජාපයට ඡන්දය දීමේ හැකියාවක් නොවීය. එජාපය ශ්‍රී ලංකා ධනේශ්වරයේ පැරනිතම පක්ෂය වන අතර 1983 වසරේදී එල්ටීටීඊයට එරෙහිව යුද්ධය දියත් කිරීමේ වගකීම ද දරයි. ව්‍යාපාර ගැති ප්‍රතිපත්ති හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කල රුදුරු ප්‍රහාර සම්බන්ධයෙන් එහි වාර්තාව කුප්‍රකටය. යලි ඇවිලූ රාජපක්ෂගේ යුද්ධයට මෙන්ම එල්ටීටීඊයේ පරාජයෙන් පසුව දෙමල සිවිල් වැසියන් දෙලක්ෂ පනස්දහසකට වැඩි පිරිසක් රැඳවුම් භාරයට ගැනීමේ ඔහුගේ සාපරාධී ක්‍රියාවන්ට ද එජාප පිටුබලය දුන්නේය.

සියයට පහකට මඳක් වැඩි ජවිපෙ මැතිවරන ප්‍රතිපලය විනාශකාරීය. ජවිපෙ ආසන සංඛ්‍යාව 27 සිට ඩීඑන්ඒ හි ආසන 5 ක් හෝ 6 ක් දක්වා පහත වැටුනි. ජවිපෙ බලකොටු ලෙස සලකාගත් හම්බන්තොට හා මාතර වැනි දකුනේ දිස්ත්‍රික්කවල හා දකුනේ මෙන්ම බොහෝ ග්‍රාමීය ප්‍රදේශවලින් ද පක්ෂය තල්ලුවී ගියේය. ඩීඑන්ඒ ට දිනාගත හැකි වූයේ කොලඹ ගම්පහ හා කලුතර දිස්ත්‍රික්ක වලින් ආසන කිහිපයක් පමනි. ජාතික ලැයිස්තුවෙන් තවත් එක් ආසනයක් හිමිවනු ඇත.

එජාප හා එජනිස නායකත්වය දරන රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) යන ප්‍රධාන දෙපක්ෂයට විකල්පයක් ලෙස, ජවිපෙ දැකගත් පුලුල් ස්ථරයන් අතර එය තරයේම අපකීර්තියට පත්ව ඇත. 2004 දී ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් ආන්ඩුවට ඇතුල්වී එහි නිගාමී ප්‍රතිපත්ති වලට සහාය දීමෙන් පසුව ජවිපෙ වෙතින් ඡන්දදායකයෝ ඉවත්වීමට පටන් ගත්හ. 2005 ජනාධිපතිවරනයේදී රාජපක්ෂට පිටුබලය දෙමින් ජවිපෙ සිය සහයෝගිතා පදනම යලි ගොනුකර ගැනීමට උත්සාහ කල ද 2008 දී ඔහුගේ ආන්ඩුවට ඇතුල්වනවා ද නැද්ද යන ප්‍රශ්නය මත එය බිඳී ගියේ මන්ත්‍රීන් 12 දෙනෙක් ද අහිමි කරගනිමිනි. අද දින පුලුල් වශයෙන් ජවිපෙ සලකන්නේ කොලඹ දේශපාලන සංස්ථාපිතයේ තවත් එක් අවස්ථාවාදී පක්ෂයක් ලෙස පමනි.

උතුර හා නැගෙනහිරේදී පහත් ඡන්දදායක සහභාගිත්වය, කලින් එල්ටීටීඊ හොරනෑව ලෙස කටයුතු කල ටීඑන්ඒ හෙවත් දෙමල ජාතික සන්ධානය ද ඇතුලු සියලු ද්‍රවිඩ පක්ෂ කෙරෙහි පලවූ මහජන පිලිකුල හා කෝපය පිලිබඳ මිනුමකි. ජනාධිපතිවරනයේදී එය රාජපක්ෂට එරෙහිව අඩු නපුර ලෙස සලකමින් ෆොන්සේකාට පිටුබලය දුන්නේය. ටීඑන්ඒ දැනට ආසන 12 දිනාගෙන සිටින අතර ත්‍රිකුනාමලයේ අවසන් ප්‍රතිපලය නිකුත්වීමෙන් පසුව තවත් කිහිපයක් එක්කරගනු ඇත. එහෙත් තව දුරටත් එයට දෙමල ඡන්දදායකයන් අති මහත් බහුතරයකගේ සහාය නොලැබෙනු ඇත.

සමස්ත මාධ්‍ය හා දේශපාලන සංස්ථාපිතයම වෑයම් කරන්නේ දිවයින පුරා ඡන්දදායකයන්ගේ අඩු සහභාගිත්වය පිලිබඳ වැදගත්කම වසං කිරීමට ය. ඔවුන් "පලාත්බදව තියුනු මැතිවරන ව්‍යාපාරයක් ගෙනගොස් තිබුනා නම් ඡන්දදායක සහභාගිත්වය බෙහෙවින් ඉහල යා හැකිව තිබුනි" යනුවෙන් මවිතකරවන වෙට්ටුවක් දැමූ ප්‍රවාහන ඇමති ඩලස් අලහප්පෙරුම, විපක්ෂයට චෝදනා කලේය.

එජාප මහ ලේකම් අත්තනායක ප්‍රතිපලය ඡන්දදායක උදාසීනත්වය මත පටවමින් මෙසේ පැවසීය. "රටට දැවැන්ත වැයක් පටවමින් ආන්ඩුව මැතිවරන පවත්වා ඇති වාරගනන හේතුකොට ගෙන ජනතා උනන්දුව හීනවී ගොස් ඔවුන් උදාසීන වී ඇත." මෙවැනි ම ආස්ථානයක් ගනිමින් ඩේලි මිරර් කතුවැකියෙන් කියා තිබුනේ, පාර්ලිමේන්තු මැතිවරනයට මඳකට කලියෙන් ජනාධිපතිවරනය පැවැත්වීමට ගත් තීරනය නිසා "ඊයේ පැවති මැතිවරනය තුල ජනතා සහභාගිත්වයේ විශාල වැටීමක් සිදුවිය"

යථාර්තය නම්, සමස්ත දේශපාලන සංස්ථාපිතය හා වැඩකරන ජන සමූහය අතර ඇතිව තිබෙන දැවැන්ත ආගාධය මෙම ප්‍රතිපලයෙන් පෙන්නුම් කරන්නේය යන්නයි. කම්කරුවන්, තරුන ජනතාව හා ගම්බද දුගීන් තවදුරටත් කිසිදු ප්‍රධාන පක්ෂයක බොරු පොරොන්දු කෙරේ විශ්වාසය නොතබන අතර ඡන්දය ම නොදී සිටීම මගින් සිය හුදෙකලාව හා කෝපය පලකොට තිබේ. මෙහි ප්‍රතිපල වශයෙන්, රාජපක්ෂ ආන්ඩුව ජීවන තත්වයන් තුලට තවදුරටත් කාවදින ජාමූඅ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පටන් ගත් කල, පන්ති ගැටුම් පුපුරා යාම සඳහා වේදිකාව සැකසෙනු ඇත.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) මෙම මැතිවරනය තුල උද්ඝෝෂනය කලේ, සූදානම් කෙරෙමින් තිබෙන රුදුරු ප්‍රහාර පිලිබඳව කම්කරු පන්තියට අනතුරු අඟවමින්, ධනපති පක්ෂවලින් හා ඒවායේ විවිධ මුක්කු ලෙස ක්‍රියාත්මක වන හිටපු රැඩිකලුන් හා වෘත්තීය සමිති වලින් ද ස්වාධීනව එය මෙහෙයවීමේ ආරම්භකත්වයක් ගනිමිනි. පාලක ප්‍රභූව හා එහි දේශපාලන නියෝජිතයන් කෙරෙහි පිලිකුල හා කෝපය පමනක් සෑහෙන්නේ නැති බව අපි කම්කරුවන්ට අනතුරු අඟවමින් කියා සිටියෙමු. අවශ්‍යව ඇත්තේ, බංකොලොත් ධනපති ක්‍රමයට එරෙහි ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් තුලට ශ්‍රී ලංකාවේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තිය ඒකාබද්ධ කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක් හා පක්ෂයකි.

මෙම මැතිවරනයේදී සමාජවාදී විකල්පයක් සඳහා සටන් වැදුනේ සසප හා එහි අපේක්ෂකයන් පමනි. පක්ෂය අපේක්ෂකයින් ඉදිරිපත් කල දිස්ත්‍රික්ක හතරෙන්ම කුඩා නමුත් වැදගත් ප්‍රතිචාරයක් එනම් ඡන්ද 371 එය දිනාගත්තේය. කම්කරුවන් හා තරුනයන් අතර වඩාත්ම පන්ති සවිඥානකත්වයෙන් යුත් කොටස නියෝජනය කලේ මෙම ඡන්දදායකයින් වන අතර දැන් ඔවුන් සසපයට බැඳීම සඳහා ඉල්ලුම් කිරීම ගැන බැරෑරුම්ව සිතා බැලිය යුතුය. ඒ සමග ම, දැන් තමන් මුහුනපා සිටින දේශපාලන අන්තරායන් ගැන බරෑරුම්ව සලකා බලන ලෙස කම්කරු පන්තිය වෙත අපි පුලුල් ඉල්ලීමක් ද කරන්නෙමු. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* දිනපතා පල කරන අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය හදාරමින්, එලඹෙන පන්ති සටන් සඳහා මෙම පක්ෂට බැඳී එය ගොඩනගන ලෙස ද අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org